# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1822/01 – 2013 අගෝස්තු 05 වැනි සඳුදා – 2013.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (මහරගම නගර සභා සීමාව තුළ), ගංගොඩවිල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2013/172 සහ 2013.03.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7078 ක් පමණ වූ පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.6856**

උතුරට: පී. කැකුලාවල හිමිකම් කියන කැකුලාවල පෙදෙසේ වරි. අංක සොයාගත නොහැකි ඉඩම, කැකුලාවල පෙදෙසේ වරි. අංක 22/4, 22/3 දරන ඉඩම් සහ පාර; නැගෙනහිරට: පාර සහ පරණ කැස්බෑව පාර; දකුණට: පරණ කැස්බෑව පාර, ඒ. අයි. අමරසේකර හිමිකම් කියන දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර, කැබලි අක්ෂර බී, ඒ. දයානන්ද හිමිකම් කියන දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර, වලව්වත්ත පාරේ වරි. අංක 51 සහ 49ඒ දරන ඉඩම්; බටහිරට: වලව්වත්ත පාරේ වරි. අංක 49, 49/1 දරන ඉඩම්, පී. කැකුලාවල හිමිකම් කියන කැකුලාවල පෙදෙසේ වරි. අංක සොයාගත නොහැකි ඉඩම සහ කැකුලාවල පෙදෙසේ වරි. අංක 22/4, 22/3 දරන ඉඩම්.

02. **කැබලි අක්ෂර 'බී' – දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0222**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ ඒ. අයි. අමරසේකර හිමිකම් කියන දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර; නැගෙනහිරට: ඒ. අයි. රංජිත් අමරසේකර හිමිකම් කියන දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර සහ පරණ කැස්බෑව පාර; දකුණට: පරණ කැස්බෑව පාර සහ ඒ. දයානන්ද හිමිකම් කියන දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර; බටහිරට: ඒ. දයානන්ද හිමිකම් කියන දියපොරගහවත්ත හෙවත් කහටගහකුඹුර සහ කැබලි අක්ෂර ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2013/යූඩීජී/19.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මහ/ඉ/අත්/340.
2013 ජූනි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 667

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ


1A – G 18054 – 270 (2013/08)


මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, ගෝනවල ගමේ පිහිටි මහනුවර කොට්ඨාස භාර සර්වේයර් ජනරාල්ගේ අංක මහ/කේඑන්ඩී/2012/557 සහ 2012.12.21 දින දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.0488 ක් පමණ වූ කිංග්ස්ටන්වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

**කැබලි අක්ෂර 'ඒ' – කිංග්ස්ටන්වත්ත – ප්‍රමාණය: හෙක්. 1.0488**

උතුරට: මාර්ග (ප්‍රාදේශීය සභා), ඒ. ජී. සුමනදාස හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත සහ මාර්ග (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: ගාමිණී සෙනවිරත්න හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත සහ සෙනවිරත්න හිමිකම් කියන කිංග්ස්ටන්වත්ත; දකුණට සහ බටහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/15/2012/වීර්/188.
2013 ජූනි මස 20 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 668

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ, හිඟුරක ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක 4/3/15/2011/වීර්/296 සහ 2013.04.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' සිට 'ඊ' දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1369 ක් පමණ වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හිඟුරක්දමන – ප්‍රමාණය: හෙක්. 0.0159**

උතුරට: ඩබ්. ඒ. ඩිංගිරි මැණිකේ විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: ඩබ්. ඒ. ඩිංගිරි මැණිකේ විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස සහ කේ. ඒ. ජයතිලක භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; දකුණට: කැබලි අක්ෂර බී සහ සී; බටහිරට: කැබලි අක්ෂර සී.

02. **කැබලි අක්ෂර 'බී' – හිඟුරක්දමන – ප්‍රමාණය: හෙක්. 0.0215**

උතුරට: ඩබ්. ඒ. ඩිංගිරි මැණිකේ විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස සහ කේ. ඒ. ජයතිලක විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: කේ. ඒ. ජයතිලක විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස සහ කේ. ඒ. ඩී. අශෝකා කන්නන්ගර විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; දකුණට: කැබලි අක්ෂර ඩී සහ සී; බටහිරට: කැබලි අක්ෂර සී සහ ඒ.

03. **කැබලි අක්ෂර 'සී' – ප්‍රමාණය: හෙක්. 0.0874**

04. **කැබලි අක්ෂර 'ඩී' – හිඟුරක්දමන – ප්‍රමාණය: හෙක්. 0.0078**

උතුරට: කේ. ඒ. ජයතිලක විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස සහ කේ. ඒ. ඩී. අශෝකා කන්නන්ගර විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: කේ. ඒ. ඩී. අශෝකා කන්නන්ගර විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස සහ කේ. ටී. ඒ. පොඩිඅප්පුහාමි විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; දකුණට: කැබලි අක්ෂර ඊ සහ සී; බටහිරට: කැබලි අක්ෂර සී සහ බී.

05. **කැබලි අක්ෂර 'ඊ' – හිඟුරක්දමන – ප්‍රමාණය: හෙක්. 0.0043**

උතුරට: කේ. ඒ. ඩී. අශෝකා කන්නන්ගර විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස සහ කේ. ටී. ඒ. පොඩිඅප්පුහාමි විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: කේ. ටී. ඒ. පොඩිඅප්පුහාමි විසින් භුක්ති විඳින ඉඩමේ ඉතිරි කොටස; දකුණට: ඇළ රක්ෂිතය සහ කැබලි අක්ෂර සී; බටහිරට: කැබලි අක්ෂර සී සහ ඩී.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/15/2011/වීර්/296.
2013 ජූනි මස 20 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 669

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.